# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2300/19 – 2022 ඔක්තෝබර් 05 වැනි බදාදා – 2022.10.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2022 අංක 140 දරන ආඥාව**

*මගේ යොමු අංකය*: 4-3/6/2019/HW/451.
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය*:
DSB/LND/03/F1/35-XXXVI

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ I වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට *නැතහොත්*, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ II වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමීත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

**හරින් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2022 ජූලි මස 27වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.–** ප්‍රාදේශීය ලේකම්, බෙලිඅත්ත

2. **ඉඩමේ විස්තරය.–** දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු ගිරුවා පත්තුව සුළු කොට්ඨාසයේ, ගැටමාන්න ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක H/BLA/2019/677 සහ 2019.12.06 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර ''A'' – පැලපොල්කොරටුව *නොහොත්* මහහෙරලියගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0392**

උතුරට: දක්ෂිණ අධිවේගී මාර්ගයට අත්කරගන්නා ලද ඉඩම; නැගෙනහිරට: දක්ෂිණ අධිවේගී මාර්ගයට අත්කර ගන්නා ලද ඉඩම සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර B; දකුණට: කලුදුරගේ විමලාවතී හිමිකම් කියන පැලපොල්කොරටුව *නොහොත්* මහහෙරලියගහවත්ත සහ දක්ෂිණ අධිවේගී මාර්ගයට අත්කරගන්නා ලද ඉඩම; බටහිරට: දක්ෂිණ අධිවේගී මාර්ගයට අත්කරගන්නා ලද ඉඩම.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

02. **කැබලි අක්ෂර ''B'' – පැලපොල්කොරටුව නොහොත් මහහෙරලියගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0511**

උතුරට: දක්ෂිණ අධිවේගී මාර්ගයට අත්කරගන්නා ලද ඉඩම; නැගෙනහිරට: මෙම අනුරේඛයේ කැබලි අක්ෂර C සුදත් ගමගේ අබේනායක හිමිකම් කියන පැලපොල්කොරටුව *නොහොත්* මහහෙරලියගහවත්ත; දකුණට: කලුදුරගේ විමලාවතී හිමිකම් කියන පැලපොල්කොරටුව *නොහොත්* මහහෙරලියගහවත්ත; බටහිරට: මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර A.

03. **කැබලි අක්ෂර ''C'' – පැලපොල්කොරටුව නොහොත් මහහෙරලියගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0034**

උතුරට: දක්ෂිණ අධිවේගී මාර්ගයට අත්කරගන්නා ලද ඉඩම; නැගෙනහිරට: මෙම අනුරේඛයේ කැබලි අක්ෂර D සුදත් ගමගේ අබේනායක හිමිකම් කියන පැලපොල්කොරටුව නොහෝත් මහහෙරලියගහවත්ත; දකුණට: සුදත් ගමගේ අබේනායක සහ කලුදුරගේ විමලාවතී හිමිකම් කියන පැලපොල්කොරටුව *නොහොත්* මහහෙරලියගහවත්ත; බටහිරට: මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර B සහ දක්ෂිණ අධිවේගී මාර්ගයට අත්කරගන්නා ලද ඉඩම.

04. **කැබලි අක්ෂර ''D'' – පැලපොල්කොරටුව නොහොත් මහහෙරලියගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0047**

උතුරට: මෙම අනුරේඛයේ කැබලි අක්ෂර C සහ දක්ෂිණ අධිවේගී මාර්ගයට අත්කරගන්නා ලද ඉඩම; නැගෙනහිරට: සුදත් ගමගේ අබේනායක හිමිකම් කියන පැලපොල්කොරටුව *නොහොත්* මහහෙරලියගහවත්ත; දකුණට: සුදත් ගමගේ අබේනායක සහ කලුදුරගේ විමලාවතී හිමිකම් කියන පැලපොල්කොරටුව *නොහොත්* මහහෙරලියගහවත්ත; බටහිරට: මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර C සහ දක්ෂිණ අධිවේගී මාර්ගයට අත්කරගන්නා ලද ඉඩම.

EOG 10 - 0015

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2022 අංක 77 දරන ආඥාව**

*මගේ අංකය*: 4-3/18/2020/WS/240.
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය*: DIVUD/LND/ACQUI/04/WTR/16.

අංක 2269/63 හා 2022.03.04 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* 1A පිටුවෙහි භාෂාත්‍රයෙන් පළ කරන ලද 2022 අංක 77 දරන ලද ආඥවේ සඳහන් ''ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: AMB/LD/07/AQ/126 යන්න, DIVUD/LND/ACQUI/04/WTR/16" ලෙසද කැබලි අක්ෂර A හි නැගෙනහිරට දකුණට සහ බටහිරට අදල මායිම් විස්තරවල සඳහන් ආර්. ජී. ඉන්ද්‍ර පද්මලතා හිමිකම් කියන කෝන්ගහමුලහේන වත්ත යන්න'' ''ආර්. පී. ඉන්දා පද්මලතා හිමිකම් කියන කෝන්ගහමුලහේන වත්ත'' ලෙස නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

**හරින් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 20 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 10 -0016

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.